# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2117/51 – 2019 අප්‍රේල් 04 වැනි බ්‍රහස්පතින්දා – 2019.04.04

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උපවගන්තිය යටතේ, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය, ගයන්ත කරුණාතිලක වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, උඩුදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගන්දෙකේ කෝරළේ සුළු කොට්ඨාසයේ, කන්දේගම (අ.ග.පි. 504) ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක මහ/යූඩීඩී/2014/541 හා 2016.11.09 දිනැති ප්‍රගමන අනුරේඛනයේ පහත සඳහන් ඉඩම් කැබැල්ලට මායිම්:

01. කැබලි අක්ෂර 'ඒ' – කොබෝනීලවත්ත – ප්‍රමාණය: හෙක්. 2.0040

උතුරට: කන්දෙකුඹුර ගම සහ අ.ග.පි. 504හි කැබලි අංක 15; නැගෙනහිරට: අ.ග.පි. 504හි කැබලි අංක 15 සහ අඩි පාර; දකුණට: අඩි පාර සහ අ.ග.පි. 504හි කැබලි අංක 131; බටහිරට: කන්දෙකුඹුර ගම.

ගයන්ත කරුණාතිලක,<br>
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

යොමු අංකය: 4/3/2/2012/එෆ්ආර්/178.<br>
2019 ජනවාරි මස 03 වැනි දින,<br>
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,<br>
"මිහිකත මැදුර",<br>
රජමල්වත්ත පාර,<br>
බත්තරමුල්ල.

04 – 645



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*